Copyrighted Material

THE PERFECT MARRIAGE?
OR THE PERFECT LIE?

AN INSTANT *NEW YORK TIMES* AND *USA TODAY*
BESTSELLER AND INTERNATIONAL PHENOMENON

# BEHIND CLOSED DOORS

B.A. PARIS

# මරුවා සමග වාසේ

MusesBooks®

www.musesbooks.com

Copyrighted Material

# වර්තමානය

මුළුතැන්ගෙයි කිරිගරුඬ පාෂාණයෙන් නිමැවූ මේසයට එදිරිව ගැටුණු ෂැම්පේන් බෝතලයේ හඬින් මම තිගැස්සී ගියෙමි. මා ජැක් වෙත බැල්මක් හෙළුවේ මේ මොහොතේ මා කෙතරම් චංචලව ඇත්දැයි යන්න ඔහුගේ නෙත නොගැටෙනු ඇතැයි බලාපොරොත්තුවෙනි. මගේ බැල්ම එක් නිමේෂයකින් හසුකරගත් හේ සිනහසුණේය.

"නියමයි," ඔහු මෘදු හඬින් තෙපලීය.

මගේ අතින් අල්ලාගත් ජැක්, අපගේ අමුත්තන් බලාහිඳින ඉසව්ව වෙත මා රැගෙන ගියේය. සාලය හරහා ගමන්කරත්ම ඩයෑන් සහ ඇඩම් අපගේ උද්‍යානයේ පැළකරනු වස් රැගෙන ආ ලිලී මල් බඳුන මගේ නෙතගැටිණ. ඒ වනාහි කෙතරම් අලංකෘත රෝස පැහැයක්ද යත්, මට මගේ නිදන කාමරයේ කවුළුවෙන් නැරඹිය හැකි තැනක ජැක් එය සිටවනු ඇතැයි මම උදක්ම බලාපොරොත්තු වීමි. උද්‍යානය ගැන සිතීමෙන්ම මගේ අභ්‍යන්තරයෙන්ම ඉපිද එන කඳුළු බිඳු මම එසැණින් සඟවාගතිමි. බොහෝ දේවල් සිදුවෙමින් පවතින මේ රාත්‍රියේ, මා මගේ සම්පූර්ණ අවධානය මේ මොහොතේ සිදුවන දේ ගැන පමණක්ම යොමුකළ යුතුව ඇත.

විසිත්ත කාමරයේ ඇති පෞරාණික පෙනුමැති ගිනිමැස්ස තුළ දිගින් දිගටම ගින්දර දැල්වෙමින් තිබිණ. අප මේ ගෙවමින් හිඳින්නේ මාර්තු මාසයේ ආරම්භය වුවද ශීත ඍතුවේ ශීතල තවමත් නොනැසී තිබිණි. ජැක්ට අවශ්‍ය අපගේ අමුත්තන් හැකි උපරිම අන්දමින් සුවපහසුව තැබීමටය.

Copyrighted Material



"ඔයාලගේ ගෙදර නම් වෙනමම ලස්සනක් තියෙන්නෙ ජැක්," රූෆස් කීවේ ප්‍රශංසනීය ස්වරයෙනි. "නැද්ද මම අහන්නෙ, එස්තර්?"

මා එස්තර්ව හෝ රූෆස්ව හෝ හඳුනන්නේ නැත. ඔවුන් මේ ප්‍රදේශයට අලුත පැමිණි යුවළකි. එහෙයින් අප මේ රාත්‍රියේ මුණගැසෙන්නේ පළමුවරටය. මා පෙරටත් වඩා චංචලව හිඳීමට එයද හේතුවකි. කෙසේවෙතත් මට ජැක්ගේ සිත වියවුල් කළ නොහැකි බැවින් මුහුණෙහි අලවාගත් සිනහවක් පෙරදැරිව මා දෙවියන් යදිමින් පැතුවේ ඔවුන් මා ප්‍රියකරනු ඇතැයි යන්නය. එස්තර් පෙරළා සිනාසුණේ නැත. ඉදින් මා සිතුවේ ඈ තවමත් තීරණයකට එළැඹ නැති බවය. කෙසේවෙතත් ඇයට වරදක් කිව හැකි නොවේ. මසකට පමණ පෙර අපගේ මිතුරු කවයට එක්වූ පළමු දින සිටම සර්වසම්පූර්ණ නිවහනකුත්, සර්වසම්පූර්ණ සැමියෙකුත්, සර්වසම්පූර්ණ ජීවිතයකුත්, එකී මෙකී සියල්ලෙන්ම අඩු නැති, සර්වසම්පූර්ණ කාන්තාවකට උදාහරණයකැයි කිව හැකි ග්‍රේස් ඒන්ජල් ගැන, සුප්‍රසිද්ධ නීතිඥ ජැක් ඒන්ජල්ගේ බිරිඳ ග්‍රේස් ගැන ඇය අනේක වාරයක් අසා ඇති බැව් මට විශ්වාසය. යම් හෙයකින් මා එස්තර් වූවා නම්, ග්‍රේස් යන ගැහැනිය ගැන මටද ඇතිවනුයේ සැකසහිත හැඟීමකි.

ඈ තම බෑගයෙන් පිටතට ගත් මිල අධික චොක්ලට් පෙට්ටිය දකිත්ම මට දැනුණේ උද්වේගකර හැඟීමකි. එය ජැක් අතට පත්වීමේ ඉඩ අහුරමින් මම ඇයට සමීප වීමි. ඇයද එය අවබෝධ කරගත් පරිද්දෙන් චොක්ලට් පෙට්ටිය මා වෙතට දිගු කළාය.

"තැන්ක් යූ, පේන විදිහට නම් ඒක රස චොක්ලට් එකක් වගේ," චොක්ලට් පෙට්ටිය තේ මේසය මත තබමින් මා කීවේ ස්තුතිපූර්වක හැඟීමෙනි. පසුව කෝපි පිළිගන්වන විට අපට එයද විවරකර අමුත්තන්ට පිළිගැන්විය හැකිවනු ඇත.

මම එස්තර්ව අගය කළෙමි. ඈ උස්ය. සිහින්ය. තඹ පැහැ කෙස්වැටියකින් යුතුය. අල්පභාෂීය. ඩයෑන්ට වඩා හාත්පසින්ම වෙනස්ය. අනෙක්අතට අපගේ නිවෙසට ආ අමුත්තන් අතරින් පළමු වතාවට නිවසේ වශීකෘත පෙනුම පිළිබඳ සැලකිල්ලක් නොදක්වා හිඳි තැනැත්තිය වූයේ එස්තර්ය. ඒ හේතුවෙන්ද මගේ සිතෙහි ඇත්තේ ඈ කෙරෙහි පැහැදීමකි. මෙම නිවෙස තෝරාගැනීම තමන් තනිව සිදුකළ යුතු යැයි ජැක් බලකර කියාසිටියේ එය ඔහුගෙන් මට ලැබෙන විවාහ ත්‍යාගය බැව් කියමිනි. ඉදින් මාද මේ නිවෙස ප්‍රථම

Copyrighted Material



වතාවට දුටුවේ මදුසමය නිමකර මෙහි පැමිණි මුල් දිනයේදිය. එය අප දෙදෙනාට කෙතරම් අපූර්ව, සර්වසම්පූර්ණ නිවහනක්දැයි ඔහු කොතෙකුත් විස්තර කර තිබුණද, ඔහු ඒ අදහස් කළ දේ කුමක්දැයි නිවහන දුටු පළමු දිනම මම හරියාකාරව තේරුම්ගතිමි. ගම්මානයේ දුර ඈත කෙළවර, අතිවිසල් ගෙවුයනක මධ්‍යයේ පිහිටි නිවහන, ජැක් නිරන්තරයෙන් ආශා කළ පෞද්ගලිකත්වයත්, ස්ප්‍රින්ග් ඒටොන් ප්‍රදේශයේ සුන්දරතම නිවහනට හිමිකම් දැරීමේ ගෞරවයත් ඔහුට හිමිකර දී තිබිණ. බිම්මහලේ කවුළුවල ආරක්ෂාවට වානේවලින් නිමැවූ කවුළු පියන්ද, අතිසංකීර්ණ ආරක්ෂිත අනතුරු ඇඟවීමේ සංඥා පද්ධතියකින්ද එය සමන්විතය. දහවල් කාලයේ ඒ සියල්ල වසා තිබීම තරමක් අස්වාභාවික වුවද ඒ පිළිබඳ විමසන ඕනෑම කෙනෙකුට ජැක් දුන් පිළිතුර වූයේ, ඔහුගේ රැකියාවේ ස්වභාවය අනුව නිවහනේ සුරක්ෂිතතාවයට තමන් ප්‍රමුඛත්වය දී ඇති බවයි.

අපගේ විසිත්ත කාමරයේ බිත්තිවල එල්ලූ සිතුවම් බොහොමයක් ඇතැත්, බොහෝදෙනෙකුගේ අවධානය උදුරාගත්තේ ගිනිමැළයට ඉහළින් එල්ලා ඇති විශාල රත් පැහැ කැන්වසයයි. මින් පෙරද එය දැක ඇති ඩයෑන් සහ ඈඩම්, යළිත් වරක් ඒ වෙත සමීපව නරඹමින් හුන්හ. රූෆස්ද ඔවුන්ට එක්ව ඇත. එස්තර්, ක්‍රීම් පැහැති ලෙදර් සෝෆාව මත අසුන්ගෙන හුන්නාය.

"ඒක නම් මාරයි," රූෆස් කීවේ සිතුවම දෙස බැල්මක් හෙළමිනි. සිතුවමේ බොහෝ ප්‍රමාණයක් මවා තුබූ සිය ගණනක කුඩා සලකුණු ඔහුගේ සිත් ඇදගෙන තිබිණ.

"ඒකට කියන්නෙ 'කලාමැදිරියෝ' කියලා," ෂැම්පේන් බෝතලයේ වයරය ගලවා ඉවත්කිරීමට ඉදිරිපත්වෙමින් ජැක් කීය.

"මේ වගේ චිත්‍රයක් මම කොහෙවත් දැකලා නෑ."

"ඒක ඇඳලා තියෙන්නෙ ග්‍රේස්," ඒ ඩයෑන්ය. "හිතාගන්නවත් බෑ නේද?"

"ඔයාලා ග්‍රේස්ගේ අනිත් චිත්‍රත් දකින්න ඕනේ," ජැක් කීවේ සිහින් හඬක් නංවමින් බෝතලයේ කිරල ඇබය බුරුල් කරමිනි. "ඒවා ඇත්තටම විශිෂ්ටයි."

රූෆස් විසිත්ත කාමරය සිසාරා නෙත් හෙළුවේ මහත් උනන්දුවෙනි. "ඒවාත් මෙහෙ තියෙනවද?"

"ඒවා නම් එල්ලලා තියෙන්නෙ ගෙදර වෙන තැනක."

"ඒවා ජැක්ට පේන්න විතරයි," ඈඩම් කවටකම් කළේය.

www.musesbooks.com

Copyrighted Material



"ඒ වගේම ශ්‍රේස්ටත්. නැද්ද ඩාලින්?" ජැක් මා වෙත සිනහවක් පාමින් විමසීය. "ඒවා අපි දෙන්නගේ ඇස්වලට විතරක් පේන්න තිබ්බම ඇති."

"සත්තකින්ම," මා ඊට එකඟ වූයේ පසෙකට හිස හරවමිනි.

අපි සියලුදෙනාම එස්තර් හුන් සෝෆාවේ අසුන්ගතිමු. ජැක් ෂැම්පේන් බෝතලය ගෙන වීදුරු එකින් එක පුරවත්ම ඩයෑන් තෘප්තිමත් කෑගැස්මක් පිටකළාය.

"ඔයාට දැන් හොඳයිද?" ඕ ඇසුවාය. "ශ්‍රේස්ට ඊයේ මාත් එක්ක දවල් කෑමට එන්න බැරිවුණා, අසනීපයෙන් හිටපු නිසා," ඈ එය වැඩිදුරටත් පැහැදිලි කළේ එස්තර් වෙත හැරෙමිනි.

"ඒක පොඩි ඔළුවේ කැක්කුමක් විතරයි," මා කීවේ ඇගේ අදහසට විරෝධය පාමිනි.

"අවාසනාවට ශ්‍රේස්ට හරි ඉක්මනට ඔළුවේ කැක්කුම අල්ලනවා," ජැක් මා දෙස සානුකම්පිත බැල්මක් හෙළීය. "හැබැයි දෙවියන්ට ස්තුතිවෙන්න ඒක වැඩි වෙලාවක් තියෙන්නෙ නෑ."

"මේ ඔයා මාව රස්තියාදු කරපු දෙවැනි වතාව," ඩයෑන් කීවාය.

"සොරි ඩයෑන්," මම සමාව ඉල්ලීමි.

"කමක් නෑ. අඩුමගාණෙ ඔයාට මේ වතාවේ ඒක අමතක වුණේ නැනේ," ඈ කීවේ සරදම් ස්වරයෙනි. "ඒකටත් එක්ක හරියන්න අපි මේ සිකුරාදා මුණගැහෙමුද? ඔයාට එදාට වෙලාවක් තියෙයිද ශ්‍රේස්? අන්තිම මිනිත්තුවෙදි මතක්වෙන, දත් දොස්තරලා මුණගැහෙන්න වෙන්කරගත්ත ඒවා එහෙම නැනේ?"

"නෑ, ඒ වගේම ඔළුවේ කැක්කුම් මොනවත් නෑ. මම එහෙම හිතනවා."

ඩයෑන් එස්තර් වෙත හැරුණාය. "ඔයත් කැමතිද එන්න? මමත් වැඩට යන නිසා අපි මුණගැහෙන්නෙ නගරයේ තියෙන මොකක්හරි රෙස්ටොරන්ට් එකකදී තමයි."

"තැන්ක් යූ. මමත් කැමතියි එන්න," එස්තර් මා වෙත හැරුණේ ඇයද අපේ ගමනට එක්වීම මා අනුමත කරන්නේද යන්න ගැන සැකයෙන් මෙනි. මම පෙරළා සිනාසුණෙමි. කෙසේවෙතත් එම ගමන මා කිසිසේත්ම නොයන්නක් බැව් මම දැනසිටියෙමි. තදබල වරදකාරී හැඟීමක් මට දැනුණේ එහෙයිනි.

ජැක් සියල්ලන්ගේම අවධානය තමා වෙත ගනිමින්, එස්තර් සහ රූෆස් වෙනුවෙන් සව්දිය පුරන්නට යෝජනා කළේ, ඔවුන් දෙදෙනාව

Copyrighted Material



මෙම ප්‍රදේශයට ආදරයෙන් පිළිගනිමිනි. මම මගේ වීදුරුව ඉහළට ඔසවා ෂැම්පේන් උගුරක් තොලගෑවෙමි. මගේ මුව තුළ ෂැම්පේන් බුබුළු එහා මෙහා චලනය වත්ම මට එක් නිමේෂයකට සොම්නසක් දැනිණ. මා උත්සාහ කළේ එම හැඟීමෙහි එල්බ සිටින්නටය. නමුත් එසැණින් එය අතුරුදන් විය.

ජැක් මහත් උනන්දුවෙන් රූෆස් සමඟ කතාබහක පැටලී ඇති අයුරු මම දුටුවෙමි. ඔහුටත්, ඇඩම්ටත් රූෆස්ව මුණගැසී තිබුණේ මින් සති කිහිපයකට ඉහතදී ගොල්ෆ් සංගමයේදීය. ඔවුන් ඔහුටද තමන් හා එක්ව තරග කිරීමට ඇරයුම් කර තිබිණි. රූෆස් ඉතා දක්ෂ ගොල්ෆ් ක්‍රීඩකයෙකු බවත්, තමන් අබිබවා යෑමට තරම් එම දක්ෂතාවය සුවිශේෂී නොවන බවත් තේරුම්ගත් පසු, ජැක් ඔහුටත් එස්තර්ටත් රාත්‍රී භෝජන සංග්‍රහයකට ආරාධනා කර තිබේ. ඔවුන් දෙදෙනා එක්ව හිඳින අයුරු දෙස බලත්ම, ජැක් රූෆස්ගේ හිත දිනාගැන්මට උත්සාහ දරන බැව් මොනවට පැහැදිලිය. ඉදින් මමද එස්තර් සමඟ මිත්‍රත්වයක් ගොඩනඟා ගැනීම වැදගත් වනු ඇත. කෙසේවෙතත් එය ලේසිපහසු කටයුත්තක් නොවේ. ඩයෑන් යනු සරවලම තේරුම්ගත හැකි, ප්‍රියමනාප තැනැත්තියක වුවද එස්තර් ඊට හාත්පසින්ම වෙනස් සංකීර්ණ චරිතයකි.

සියල්ලන්ගෙන්ම සමාව අයැද මා මුළුතැන්ගෙට ආවේ මොහොතකට පෙර මා පිළියෙල කළ කැනපීස් පිළිගන්වා, රාත්‍රී භෝජන සංග්‍රහයේ අවසානය සනිටුහන් කිරීමටය. ජැක් විසින් අතිශය අගය කරන ආචාරධර්මවලට අනුව මා එම කාර්යයට දිගු වේලාවක් ගැනීම නොමනා දෙයකි. ඉදින් මම වහ වහා භාජනයක හොවා තුබූ බිත්තර සුදුමද සියල්ල වේගයෙන් කලවම් කර, මා විසින්ම පෙර සකසා තිබූ සූෆ්ලේ අතුරුපසෙහි පාදමට එක්කළෙමි.

මිශ්‍රණය වෙන් වෙන්ව දීසි මතට බෙදන මොහොතේ මම නොසන්සුන් හැඟීමෙන් ඔර්ලෝසුව දෙස බැල්මක් හෙළීමි. අනතුරුව මම දීසි සියල්ල ද්විත්ව බොයිලේරුවක් මත හොවා, විදුලි පෝරනුව තුළ තැන්පත් කළේ ඒ මොහොතේ වේලාව නිවැරදිව සිහි තබාගෙනමය. සියල්ල හරියාකාරව කරගත නොහැකි වේයැයි සිතී මා හට එක් නිමේෂයක සන්ත්‍රාසමය හැඟීමක් දැනුණද, එම භීතිය මගේ පරම සතුරා බැව් මටම සිහිගන්වමින් යළිත් මම සන්සුන් වීමි. ඉනික්බිති මා යළිත් විසිත්ත කාමරය වෙත ඇදුණේ කැනපීස්

Copyrighted Material



සහිත තැටියද රැගෙනය. සියල්ලන්ගේම ප්‍රශංසාවන් සතුටින් බාරගනිමින් මම කැනපීස් තැටිය සියලුදෙනා අතර බෙදාහැරියෙමි. ඒ සියලු ප්‍රශංසාවන් ජැක්ටද ඇසෙන බැව් සහතිකය. මගේ නළලතට හාදුවක් දෙමින් ඔහු මා විශිෂ්ට සූපවේදිනියක බවට කී ඩයැන්ගේ අදහසට එකඟතාවය පළකළේය. මා නිහඬවම සුසුමක් හෙළුවේ සැනසුම් සහගතවය.

එස්තර් සමඟ තවදුරටත් කතාබහක් ඇතිකරගැනීමේ අදිටනින්ම මම ඇගේ පසෙකින් අසුන්ගතිමි. එය දුටුවනම ජැක් මා අත තුබූ කැනපී තැටිය ඔහු අතට ගත්තේය.

"ඔයා දැන් පොඩි රෙස්ට් එකක් ගන්න ඩාලින්. අද ඔයා හුඟක් මහන්සිවෙලා මේ දේවල් ලෑස්තිකරානේ," ඔහු කීවේ සිය දිගු, හැඩැති අතැඟිලි අතර තැටිය සමබරව රඳවාගනිමිනි.

"ඒ හැටි මහන්සියක් වුණේ නෑ," මා විරෝධය පෑවද මා ඒ කීවේ මුසාවකි. ඒ බැව් ජැක්ද දනී. මන්ද යත්, භෝජන සංග්‍රහයේ මෙනුව තේරුවේද ඔහුය.

මම ප්‍රවේශමෙන් තෝරා බේරා, එස්තර්ගෙන් නිවැරදිම ප්‍රශ්න අසමින් පිළිසඳර ගෙනගියෙමි. *ඇය මේ පළාතේ ජීවිතයට හැඩගැසී ඇත්ද, කෙන්ට් ප්‍රදේශය හැරදමා ඒම ගැන කනගාටුවක් දැනුණාද, ඇගේ දරුවන් දෙදෙනා ඔවුන්ගේ අලුත් පාසලට හැඩගැසුණාද* වැනි ප්‍රශ්න. කුමක් හෝ හේතුවක් නිසා මා ඈ ගැන හොඳින් දැන හිඳීම ඇගේ සිතට වද දෙන බවක් පෙනුණු නිසාම මම ඇගේ පුතුගේත්, දියණියගේත් නම් විමසීමි. නමුත් ඔවුන්ගේ නම් සෙබස්තියන් සහ ඒස්ලින්ග් බැව් මා හොඳින්ම දැනහුන් කරුණකි. ඔවුන්ගේ වයස පවා, පිළිවෙළින් අවුරුදු හත සහ පහ බැව්ද මම දැනහුන්නෙමි. කෙසේනමුත් මම ඒවා නොදන්නා බවක් පෙන්වීමි. මගේ වචනයක් පාසා ජැක් අසා සිටින බව දන්නා නිසාම, මා මේ අර අඳින්නේ කුමකටදැයි ඔහුද සිතන බව මම දැනසිටියෙමි.

"ඔයාලට බබාලා නෑ නේද?" එස්තර් කීවේ එය ප්‍රශ්නයකටත් වඩා ප්‍රකාශයක් බවට ඒත්තුගැන්වෙන ස්වරයකිනි.

"නෑ, තාම නෑ. අපි හිතුවේ බබාලා හදන්න කලින් අපි දෙන්නා අවුරුද්දක් දෙකක් විනෝදෙන් ඉන්න ඕනේ කියලා."

"ඔයාලා දෙන්නා බැඳලා කොච්චර කල්ද?" ඇගේ හඬේ ගැබ්ව තිබුණේ පුදුමයකි.

"අවුරුද්දක්," මම කීමි.

www.musesbooks.com

Copyrighted Material



"ගිය සතියෙ මේ දෙන්නගේ පළවෙනි සංවත්සරේ," ඩයෑන්ද කතාබහට එක්විය.

"ඒත් මම තාමත් ලෑස්ති නෑ මගේ මේ ලස්සන නෝනාව තවත් කෙනෙක් එක්ක බෙදාගන්න," ජැක් කීවේ, ඩයෑන්ගේ වීදුරුව යළි පුරවමිනි.

වීදුරුවේ ගැටියෙන් පොළා පැනගත් ෂැම්පේන් බිඳිති ඔහුගේ නොකිලිටි කලිසම් කකුලේ දණ පෙදෙස මත ඉහිරෙන අයුරු මා බලාහුන්නේ මොහොතකට වෙනතකට ඇදුණු අවධානයකිනි.

"මම මෙහෙම ඇහුවට මුකුත් හිතන්න එපා," සිය කුතුහලාත්මක හැසිරීම යළිත් වරක් හුවාදක්වමින් එස්තර් කීවාය. "ඒත් ඔයාලා දෙන්නගෙන් කවුරුහරි කලින් වෙන කසාදයක ඉඳලා තියෙනවද?"

ඇගේ ස්වරයෙහි ගැබ්ව තුබුණේ, ඇය අපගෙන් අපේක්ෂා කළ පිළිතුරු 'ඔව්' යන බලාපොරොත්තුවකි. අපගේ අතීතයේ සැඟව ඇති, හිත් නොහොඳකමකින් යුත් අතීත සැමියෙකු හෝ බිරිඳක හෝ වේ නම්, අප දෙදෙනා පෙනෙන තරමටම සර්වසම්පූර්ණ යුවළක් නොවන බවට එය සාක්ෂි දරනු ඇත.

"නෑ. අපි දෙන්නම නෑ," ඒ මාය.

එස්තර්, ජැක් වෙත බැල්මක් හෙළූ අතර, එතරම් කඩවසම් පෙනුමකින් යුත් මිනිසෙක් එතුවක් කලකට තනිකඩව හුන්නේ කෙසේදැයි ඇය සිතන බැව් මට වැටහිණ. ඇගේ බැල්ම තමන් වෙත යොමුව ඇති බැව් ඉවෙන් මෙන් හඳුනාගත් ජැක්, මිත්‍රශීලී සිනහවක් පෑවේය.

"මේක මම කියන්නම ඕනේ. අවුරුදු හතළිහ වෙද්දි හොඳම බිරිඳක් හොයාගන්න ලැබෙයි කියන බලාපොරොත්තුව මම අතහැරලයි හිටියෙ. ඒත් ග්‍රේස්ව දැකපු වෙලාවෙම මම දැනගත්තා මම ඒ තරම් කාලයක් බලාගෙන හිටිය ඉරණම්කාරිය එයා කියලා."

"හරිම රොමැන්ටික්," ජැක් සහ මාගේ මුණගැසීම පිළිබඳ අතීත කතාව දැනටමත් දන්නා ඩයෑන් සුසුමක් හෙළුවාය. "මම ජැක්ව කීදෙනෙක් එක්ක ජෝඩු කරන්න හැදුවද කියලා මටම මතක නෑ. ඒත් ග්‍රේස්ව මුණගැහෙනකල් ඒ එකක්වත් හරිගියේ නෑ."

"එතකොට ග්‍රේස් ඔයා?" එස්තර් ඇසුවාය. "ඔයාටත් ඒක දැකපු මුල්ම වෙලාවෙදි ඇතිවුණ ආදරයක්ද?"

"ඔව්," මා පිළිතුරු දුන්නේ අතීතය සිහිගන්වමිනි. "එහෙම එකක් තමයි."

Copyrighted Material



අතීතස්මරණයන් දරාගත නොහුණු තැන යුහුසුලුව සිටගත් මා දෙස ජැක් හිස කරකවා බැලීය. "සූෆ්ලේ එක," මම සන්සුන්ව පැහැදිලි කළෙමි. "ඒක දැන් හරි ඇති. ඔයාලා හැමෝම එහෙනම් දැන් වාඩිවෙනවද?"

සූෆ්ලේ දීසිය තවදුරටත් අප කිසිවෙකුත් වෙනුවෙන් බලා නොඉඳිනු ඇති බව කියමින් ඩයෑන් කළ පෙරැත්ත කිරීම මත සියල්ලෝම වීදුරු පසෙකට කර කෑම මේසයේ ඉඩ සකසන්නට වූහ. කෙසේවෙතත් එස්තර් 'කලාමැදිරියෝ' සිත්තම අසල නතර වී වඩාත් සමීපව එය නරඹන්නට වූවාය. ඇයව කෑම මේසයට කැඳවනු වෙනුවට ජැක්ද ඇයට එකතු විය. සූෆ්ලේ දීසිය කිසිසේත්ම පිසී අවසන් නැති බව වැටහුණු මම සැනසුම් සුසුමක් හෙළීමි. එය සූදානම්ව තිබුණා නම් මා මානසික ආතතිය නිසාම හඬාවැටෙනු නිසැකය. ඒ, විශේෂයෙන්ම මේ මොහොතේ ජැක් 'කලාමැදිරියෝ' සිතුවම නිමකිරීමට මා යොදාගත් විවිධාකාර තාක්ෂණික ක්‍රමවේදයන් ගැන විස්තරාත්මකව පහදමින් හුන් බැවිනි.

කෙසේ හෝ තවත් මිනිත්තු පහකට පමණ පසු ඔවුන් කෑම මේසයේ අසුන්ගන්නා මොහොත වනවිට සූෆ්ලේ දීසිය මනාව පිස නිමවී තිබිණ. ඩයෑන් එය දැක සිය මවිතය පෙන්වමින් හිඳින අතරතුර මේසයේ අනෙක් කෙළවර හුන් ජැක් මා දෙස බලා සිනහසුණේ මා කෙතරම් දක්ෂද යන්න සියල්ලන්ටම පවසමිනි.

මා ජැක් සමඟ ආදරයෙන් බැඳුණේ ඇයිද යන්න මට සිහිපත් කරදීමට මෙවන් සන්ධ්‍යාවන් සමත්ව තිබිණ. සිත් ඇදගන්නාසුලු, කවටකමට ළැදි, එසේම අතිශය බුද්ධිමත් ජැක්, ඕනෑම මොහොතකදී කිවයුතු දේත්, එය කිවයුතු ආකාරයත් මනාව දැනහුන්නේය. එස්තර් සහ රූෆස් මේ පළාතට අලුතින් පැමිණි නිසාම, සූෆ්ලේ ආහාරයට ගන්නා අතරතුර අපගේ කතාබහ ඔවුන් දෙදෙනාට වාසිවන පරිදි හැසිරවීමට හේ වග බලාගත්තේය. අලුත් මිතුරන් දෙදෙනාට ඩයෑන් සහ ඇඩම්ගේ විස්තර, එනම් ඔවුන් බඩුභාණ්ඩ ගැනීමට යන එන තැන්, විනෝදය උදෙසා කරන ක්‍රීඩා ආදිය දැනගත හැකිවන අන්දමේ කතාබහක් ජැක් විසින් මෙහෙයවමින් තිබිණ. ඔවුන්ගේ විනෝදාංශ, ගෙවතු සේවකයන්ගේ සහ කුඩා දරුවන් බලාගන්නා අයගේ නම්, මාළු මිලදී ගැනීමට වඩාත්ම සුදුසු වෙළෙඳසැල් ආදියෙහි විස්තරවලට එස්තර් ඉතා ආචාරශීලී ලෙස සවන්දෙමින් හුන්නද, ඇය වඩාත් උනන්දු වන්නේ මා ගැන තොරතුරු දැනගැනීමට බව

Copyrighted Material



මම දැනහුන්නෙමි. එමෙන්ම මගේත් ජැක්ගේත් විවාහය තරමක් ප්‍රමාදව සිදුවීම සම්බන්ධ කතාබහ යළිත් මතුකරගෙන, අපගේ විවාහය පිටත ලෝකයට පෙනෙන තරම් සර්වසම්පූර්ණ නොවන බවට මොනයම් හෝ හෝඩුවාවක් සොයාගැනීමේ උත්සාහය එස්තර් විසින් අත් නොහරින බවද නිසැකය. අවාසනාවකට ඇගේ ඒ බලාපොරොත්තුව කිසිසේත්ම ඉටු නොවනු ඇත.

ජැක් විසින් හරක්මස් ව්‍යාංජනය, - කොටස්වලට වෙන්කර, යාන්තමින් මී පැණි තැවරූ අල සහ කැරට් සමඟ - අමුත්තන්ට පිළිගන්වනු ලබන තෙක් එස්තර් ඉවසිල්ලෙන් හුන්නාය. හරක්මස් කුට්ටිය උඳුනෙන් පිටතට ගැනීමට පෙර, මා උණු වතුරට දමා තැම්බූ 'ෂුගර් පී' නම් ඇට වර්ගයද ආහාරවේලට එක්ව තිබිණ. ඒ සියල්ල නිසි වේලාවට පිළියෙල කරගැනීමට මා සමත්ව තිබීම ගැන ඩයෑන් නිරන්තරයෙන්ම පුදුම වූවාය. මෙවන් භෝජන සංග්‍රහවලදී ඇය විසින් කරනු ලබන්නේ, කල්තියා පිළියෙල කරගන්නා, හොඳි වර්ගවලින් යුත් ආහාරවේලක්, අවසන් මිනිත්තුව දක්වාම හොඳින් රත්කර පිළියෙල කරගැනීම බව ඈ පිළිගත්තාය. එම ක්‍රමයට මාද වඩාත් ප්‍රියකරන බවත්, මෙවැනි සර්වසම්පූර්ණ ආහාරවේලක් පිළියෙල කිරීමට මම අතිශය වෙහෙසකාරී ගණනය කිරීම් සහ නිදි නැති රාත්‍රීන් කැපකරන බව කීමට මට අවශ්‍ය වුවත්, මම නිහඬව හුනිමි. ඒ, සර්වසම්පූර්ණ නොවන ආහාරවේලක් පිළියෙල කිරීම මට කිසිසේත්ම විකල්පයක් නොවන බැවිනි.

මේසයේ මට විරුද්ධපසින් හිඳින එස්තර් මා දෙස බැලුවාය. "ඉතින් ඉතින්, ඔයයි ජැකුයි කොහේදිද හම්බුණේ?"

"රීජන්ට්ස් පාර්ක් එකේදි," මම පිළිතුරු දුනිමි. "ඉරිදා දවසක හැන්දෑවක."

"ඒක වුණේ කොහොමද කියලා එයාට කියන්නකෝ," මා දිරිගන්වන ඩයෑන්ගේ සුදුමැලි මුහුණ, ෂැම්පේන්වලින් මත්ව, රත්පැහැගැන්වී තිබිණ.

මා එක් මොහොතකට පැකිළුණේ එය මීට පෙරද මා විසින් කියන ලද කතාවක් බැවිනි. නමුත් එය අසන්නට ජැක් ආසා කරන නිසාම, මා එය යළි යළිත් කිව යුතුය. වාසනාවකට මෙන් ඒ මොහොතේ මගේ පිහිටට ආවේ එස්තර්ය. මගේ ඒ මොහොතක විරාමය, නිහැඬියාවක් ලෙස වරදවා තේරුම්ගත් ඈ, එක්වනම මගේ අතින් අල්ලාගත්තාය.

www.musesbooks.com

Copyrighted Material



"අනේ, කියන්නකෝ," ඕ යළි පෙරැත්ත කළාය.

"මෙහෙමයි, මේක කලින් අහලා තියෙන අයට නම් කම්මැළි හිතෙයි," මම කතාව ඇරඹුවේ, සමාව අයදිනසුලු සිනහවක් පාමිනි. "මම මගේ නංගි මිලී එක්ක පාර්ක් එකේ හිටියේ. අපි නිතරම ඉරිදා හවසට පාර්ක් එකට යනවා. ඒ ඉරිදා, පාර්ක් එකේ සංගීත කණ්ඩායමක් සිංදු කිව්වා. මිලී කොහොමත් සංගීතයට කැමතියි. ඉතින් එයා ඒකෙන් හුඟක් විනෝද වුණා. කොච්චරද කියනවානම් එයා ඉඳගෙන හිටපු තැනින් නැගිටලා, බෑන්ඩ් එක ප්ලේ කරපු වේදිකාව ළඟටම ගිහින් නටන්න ගත්තා. එයා ඒ කාලේ වෝල්ට්ස් නැටුම් ඉගෙනගන්න ගත්ත අලුත. ඉතින් එයා අත් දෙකත් දික්කරගෙන නැටුවේ හරියට එයා ඉස්සරහ ඉන්න තව කෙනෙක් එක්ක නටනවා වගේ." ඒ මතකයත් සමඟ මගේ මුහුණට සිනහවක් නැගුණු අතර, ජීවිතය ඒ තරමටම අවිහිංසක, සරල වී නම් කෙතරම් අපූර්වදැයි මට සිතිණ. "එතන හිටිය අය මිලී ඒ විදිහට තනියම විනෝදවෙනවා දැකලා අවංකවම, බොහොම කරුණාවන්ත විදිහට හිතුවත් එක්කෙනෙක් දෙන්නෙක් අපහසුතාවයෙන් වගේ ඉන්න හැටි මට පෙනුණා. ඉතින් මම දැනගත්තා මම ඒකට මොකක්හරි කරන්න ඕනෙ කියලා. එක්කෝ එයාට කතාකරලා ආයේ ඉන්දවන්න ඕනේ. ඒත් මගේ හිත කිව්වේ එහෙම කරන එක වැරදියි කියලා. මොකද..."

"ඔයාගේ නංගිට වයස කීයද?" එස්තර් මගේ කතාවට බාධාකරමින් ඇසුවාය.

"දාහතයි." මම මොහොතකට කතාව නතර කළේ යථාර්ථයට මුහුණදීමට අකමැත්තෙනි. "දහ අටට කිට්ටුයි."

එස්තර් ඇහිබැම එසවූවාය. "එහෙනම් එයා අවධානය ගන්න ටිකක් කැමති කෙනෙක් වගේ නේද?"

"නෑ, එයා එහෙම නෑ. ඒක මේ..."

"නෑ, මං කියන්නෙ එයා එහෙම වෙන්න එපැයි. සාමාන්‍යයෙන් එහෙම කෙනෙක් පාර්ක් එකකදි නැගිටලා ගිහින් නටන්නෙ නැනේ, නේද?" ඕ මේසය වටා සිටින අය දෙස බැලුවේ ජයග්‍රාහී හැඟීමකින් වුවද සියල්ලන්ම ඇගේ දෑස් මගහරිනු දුටුවිට මට ඇය ගැන අනුකම්පාවක් දැනිණ.

"මිලී මන්දබුද්ධිකයි," මේසය පුරා මතුවුණු අසීරු නිහැඬියාව බිඳදමනු ලැබුවේ ජැක් විසිනි. "ඒ කියන්නෙ එයා හුඟක් වෙලාවට හරි අපූරු, ස්වභාවිකවම ක්‍රියාත්මකවෙන කෙල්ලෙක්."

www.musesbooks.com

Copyrighted Material



එස්තර්ගේ මුහුණ පුරා මතුවූ වික්ෂිප්ත හැඟීමත් සමඟ මිලී ගැන සඳහනක් කිරීම හැරුණුකොට මගේ අනෙක් සෑම තොරතුරක්ම ඇයට කියා තිබූ අය ගැන මගේ සිතේ මතුවූයේ නොමනාපයකි.

"කොහොමහරි කමක් නෑ, මොකක්ද කරන්න ඕනෙ කියලා මම හිතන්නත් කලින්," මම ඇයව එම අසීරු අවස්ථාවෙන් ගලවාගනිමින් කතාව කියාගෙන යන්නට වීමි. "මේ සර්වසම්පූර්ණ මහත්මයා එයාගේ පුටුවෙන් නැගිටලා, මිලී නට නටා හිටපු තැනට ගිහින්, ඔළුව නමලා ආචාරකරලා එයාගේ අතින් අල්ලගත්තා. මිලීත් හරියට සතුටු වුණා. ඊටපස්සේ ඒ දෙන්නා වෝල්ට්ස් නැටුමක් නටන්න ගත්තා. එතන හිටපු හැමෝම අත්පොඩි ගැහුවා. සමහර ආදරවන්ත ජෝඩු ඉඳගෙන හිටපු තැන්වලින් නැගිටලා ඒ විදිහටම නටන්න ගත්තා. ඒක හරි විශේෂ අවස්ථාවක්. ඉතින් ඒ වෙලාවේ ඒ කරපු දේ වෙනුවෙන් මගේ හිතේ ජැක් ගැන ආදරයක් ඇතිවුණා."

"ග්‍රේස් ඒ වෙලාවේ නොදැන හිටිය දේ තමයි, ඊට සතියකට කලින් මම මිලීවයි, එයාවයි පාර්ක් එකේදි දැකලා, එයා ගැන මගේ හිතේ ආදරයක් ඇතිවුණ බව. එයා හරිම පරාර්ථකාමී විදිහට, මිලී ගැන හරිම අවධානයෙන් හිටියේ. කෙනෙක් තවත් කෙනෙක් ගැන ඒ තරමටම කැපවෙලා ඉන්නවා මම කවදාවත් දැකලා නෑ. ඉතින් මටත් ඕන වුණා එයාව දැන අඳුනගන්න."

"එතකොට ජැක් ඒ වෙද්දි නොදැන හිටිය දේ තමයි..." මම කීමි. "සතියකට කලින් මමත් එයාව දැකලා තිබුණත් මම වගේ කෙනෙකුට එයා කැමතිවෙයි කියලා මම කොහොමටවත්ම නොහිතපු බව."

සියල්ලන්ම ඊට එකඟතාවය පළකරමින් හිස වනනු දුටුවිට මට දැනුණේ හාස්‍යජනක හැඟීමකි. මම පෙනුමෙන් සුරූපිනියක වුවද, ජැක් සතු සිනමා තාරකාවගේ බඳු පෙනුම නිසාම ඔහු මා විවාහ කරගැනීමට කැමති වීම මගේ වාසනාවක් ලෙස බොහෝදෙනා සිතයි. නමුත් මම අදහස් කළේ එවැන්නක් නොවේ.

"ග්‍රේස්ට වෙන සහෝදර සහෝදරියො නෑ. ඉතින් කවදාහරි දවසක මිලීගේ සම්පූර්ණ වගකීම එයා දරන්න ඕන නිසා, එයා හිතුවේ මම ඒකෙන් අධෛර්යමත් වෙයි කියලා," ජැක් පහදා දුන්නේය.

"මොකද, සමහරුන්ට එහෙම වෙලා තියෙනවා," මම තවදුරටත් කීමි.

www.musesbooks.com

Copyrighted Material



ජැක් හිස වැනීය. "මට වුණේ ඒකෙ අනිත් පැත්ත. මිලී වෙනුවෙන් ග්‍රේස් ඕනම දෙයක් කරනවා කියන එක දැනගත්තම මට තේරුම්ගියා, මගේ ජීවිතේ පුරාවටම මම හොය හොයා හිටපු සහකාරිය එයා කියලා. මගේ රස්සාවත් එක්ක මිනිස්සු කියන ජාතිය ගැන මගේ හිතේ ඒ තරම් හොඳ හැඟීමක් නෑ."

"මම මේ ඊයේ පත්තරෙන් දැක්ක දේකට සුබ පතන්නත් තියෙනවා," රූෆස් කීවේ සිය බීම වීදුරුව ජැක් දෙසට හරවා ඔසවමිනි.

"ඔව්, නියම වැඩක්," ජැක් සේවය කරන ආයතනයේම නීතිඥවරයෙකු වූ ඇඩම්ද ඒ සුබ පැතුමට එක්විය. "ඔයාගේ එකතුවට තවත් වැරදිකාරයෙක්."

"ඒක හරි පැහැදිලිව පෙනුණු තීන්දුවක්," ජැක් නිහතමානීව කීය. "ඒත් මගේ සේවාදායකයා ඒ තුවාල එයා විසින්ම කරගත්ත ඒවා නෙවෙයි කියලා ඔප්පු කරන එක ටිකක් අමාරු වුණා. විශේෂයෙන්ම එයාට තමන්ටම හානි කරගැනීම සම්බන්ධ ඉතිහාසයක් තිබුණු නිසා."

"ඒත් සාමාන්‍යයෙන් බලද්දි ඒ වගේ හිංසාවන් සම්බන්ධ නඩු ඔප්පුකරන එක එච්චර අමාරු නෑ නේද?" යම් හෙයකින් එස්තර් ඒ වනවිටත් නොදැන සිටියා නම්, ජැක් වනාහි ඔහුගේ රක්ෂාවේ ඉහළම නම් දැරූවෙකු බව, - විශේෂයෙන්ම ගෘහස්ථ හිංසාවෙන් පීඩිත බිරින්දෑවරුන්ව ගලවාගන්නෙකු බව - ඩයෑන් විසින් එස්තර්ට පහදාදෙන අතරතුර රූෆස් විමසීය. "මම මේ ඔයාගේ වැඩේ ගැන ගුණදොස් කියනවා නෙවෙයි. ඒත් ඔය වගේ නඩුවලදි ශාරීරිකව පෙන්නන්න පුළුවන් සාක්ෂි තියෙනවා නේද? එහෙම නැත්තන් සාක්ෂිකාරයෝ?"

"ජැක් හුඟක්ම දක්ෂ වින්දිතයන්ගේ විශ්වාසය ගොඩනඟලා, මොකක්ද වුණේ කියලා එයාලම ජැක්ට කියන තැනට වැඩ කරන්න," ඩයෑන් විස්තර කළාය. ඇතැම් විටක ඇගේ සිතේ ජැක් ගැන තරමක ආදරයක් ඇතැයි මට සැක සිතී ඇත. "හුඟක් ගෑනු අයට ඒ දේවල් කියන්න කෙනෙක් නෑ. ඒ වගේම එයාලා බයයි කවුරුවත් එයාලව විශ්වාස නොකරයි කියලත්."

"ඒ වගේම වැරදිකාරයෝ හුඟ කාලයක් හිරබත් කන තැනට ජැක් අනිවාර්යයෙන්ම වැඩ කරනවා," ඒ ඇඩම්ය.

"තමන්ගෙ බිරිඳට පීඩාකරන මිනිස්සු ගැන මගේ හිතේ තියෙන්නෙ අප්පිරියාවක්," ජැක් තිර හඬින් කීය. "ඒ හැම දඬුවමක්ම උන්ට හම්බෙන්න ඕන ඒවා."

Copyrighted Material



"ඒ අරමුණට මමත් බොන්නම්," රූෆස් යළිත් සිය වීදුරුව එසවීය.

"ඔයා මේ වෙනකන් එක නඩුවක්වත් පැරදිලා නෑ, නේද ජැක්?" ඒ ඩයෑන්ය.

"නෑ, මම පරදින්න ලෑස්තිත් නෑ."

"ඒක කඩන්න බැරි වාර්තාවක්. ඇත්තටම වටින දෙයක්," රූෆස් කීවේ මනා පැහැදීමකිනි.

එස්තර් මා දෙස බැලුවාය. "ඔයාගෙ නංගි, මිලී, එයා ඔයාට වඩා හුඟක් බාලයි නේද," ඇය අප විසින් කතාබහ නතර කළ තැනට යළිත් වරක් රැගෙන යාමට තැත්කරන සෙයකි.

"ඔව්, අපි අතරේ අවුරුදු දාහතරක පරතරයක් තියෙනවා. මිලී ඉපදෙනකොට මගේ අම්මට වයස හතළිස් හයයි. මුලදි එයා ප්‍රෙග්නන්ට් කියලා එයා දැනගෙන හිටියෙත් නෑ. ඉතින් පස්සේ ආයෙ අම්මා කෙනෙක් වෙන්න යන එක ගැන එයාගෙ හිතෙත් චකිතයක් තිබුණා."

"මිලී ඉන්නෙ ඔයාගේ අම්මලා ළඟද?"

"නෑ, එයා උතුරු ලන්ඩන්වල තියෙන හොඳ ඉස්කෝලෙක නැවතිලා ඉගෙනගන්නවා. ඒත් අප්‍රේල්වල එයාට දහ අට පිරෙනවා. ඉතින් එයාට මේ ගිම්හාන කාලෙදි ඉස්කෝලෙන් අයින්වෙන්න වෙනවා. ඒක නම් අපරාධයක්. මොකද එයා ඒ ඉස්කෝලෙට හරි ආසයි."

"ඉතින් ඊටපස්සේ එයා කොහෙද යන්නේ? අම්මලා ළඟටද?"

"නෑ." මම මොහොතකට කතාව නතර කළේ මා ඊළඟට කියන්න යන දේ එස්තර්ගේ පුදුමයට හේතුවන බව දන්නා බැවිනි. "මගේ අම්මලා ඉන්නෙ නවසීලන්තයේ."

එස්තර් මා දෙස බැලුවේ මවිතයෙනි. "නවසීලන්තයේ?"

"ඔව්. එයාලා ගිය අවුරුද්දෙ අපේ වෙඩින් එකෙන් පස්සේ විශ්‍රාම ජීවිතය ගෙවන්න එහේ ගියා."

"ආහ්, හරි හරි," ඇය එසේ කීවද, ඇයට මා කී දේ නොතේරුණු බැව් මම දැනගතිමි.

"මිලී අපිත් එක්ක ජීවත්වෙන්න එයි," ජැක් කීය. හේ මා දෙස බලා සිනහසුණි. "මාව කසාද බඳින්න කැමතිවෙන්න නම් ග්‍රේස් මට දාපු කොන්දේසියක් තමයි ඒක. මමත් බොහොම කැමැත්තෙන් ඒකට එකඟ වුණා."

Copyrighted Material



"අනේ, ඔයා හරිම හොඳ දෙයක් කරලා තියෙන්නෙ," ඒ එස්තර්ය.

"ඒක සුළු දෙයක්. මිලී මෙහේ ඉන්න එන එක ගැන මාත් සතුටුයි. ඒකෙන් අපේ ජීවිතවලටත් අලුත් මානයක් එකතුවෙනවා. නේද වස්තුවේ?"

මම මගේ වීදුරුව ඔසවා වයින් උගුරක් බීවේ ඔහුගේ ප්‍රශ්නයට පිළිතුරු දීම මඟහරිමිනි.

"ඔයා අනිවාර්යයෙන්ම එයා එක්ක හොඳ සම්බන්ධකමක් ඇතිකරගනියි," එස්තර් පෙන්වාදුන්නාය.

"මෙහෙමයි, මම හිතනවා මං තරමටම එයත් මං ගැන කැමැත්තක් ඇතිකරගනියි කියලා. කොහොමවුණත් ශ්‍රේසුයි මමයි ඇත්තටම කසාද බඳිද්දි එයාව ඒකට කැමති කරවගන්න ටිකක් කල් ගියා."

"ඒ ඇයි?"

"අපි කසාද බඳිනවාය කියන එක ඇත්තටම හිතන එක එයාට පොඩි ෂොක් එකක් වගේ වුණා," මම කීමි. "එයා මුල ඉඳලම ජැක්ට කැමැත්තෙන් හිටියේ. ඒත් අපි අපේ හනිමූන් එක ගෙවලා ආවට පස්සේ එයා තේරුම්ගත්තා ජැක් හැමවෙලාවෙම මාත් එක්ක ඉන්නවා කියලා. ඒකෙන් එයාට ඊරිසියාවක් දැනුණා. දැන් නම් එයාට ප්‍රශ්නයක් නෑ. දැන් ආයෙමත් ජැක් එයාගේ ප්‍රියතම කෙනා වෙලා."

"මගේ වෙලාවට මිලීගේ හතුරන්ගේ ලයිස්තුවට ජෝර්ජ් ක්ලූනි එකතුවෙලා තියෙනවා," ජැක් සිනහසුණි.

"ජෝර්ජ් ක්ලූනි?" එස්තර් ඇසුවාය.

"ඔව්." මම හිස වැනුවේ ජැක් එය සිහිපත් කරදීම ගැන සතුටිනි. "මට ඉස්සර එයා ගැන පොඩි කැමැත්තක් තිබුණා..."

"එයා ගැන කාටද එහෙම කැමැත්තක් නොතිබුණේ?" ඩයෑන් මිමිනුවාය.

"...ඉතින් මගේ යාළුවෝ වගයක් එක අවුරුද්දක නත්තලට මට ජෝර්ජ් ක්ලූනි ඉන්න කැලැන්ඩරයක් දුන්නම මිලීට ඒ ගැන ඉරිසියා හිතිලා එයා ඒක උඩ කුරුටුගෑවා, 'මම ජෝර්ජ් ක්ලූනිට කැමති නෑ' කියලා. හැබැයි එයා ඒක ලියලා තිබුණේ ජූජ් කූනි කියලා. එයාට එල් අකුරත් එක්ක පොඩි අමාරුකමක් තියෙනවා," මම විස්තර කළෙමි. "ඒක හරි ස්වීට්."

සියල්ලෝම සිනාසුණහ.

Copyrighted Material



"දැන් එයා හැමෝටම කියන්නෙ එයා මට කැමතියි, ඒත් ජෝර්ජ් ක්ලූනිට කැමති නෑ කියලා. ඒක හරියට එයාගේ මන්තරයක් වගේ - *මම ඔයාට කැමතියි ජැක්, හැබැයි මම ජූජ් කූනිට කැමති නෑ.*" ජැක් හිනැහුණි. "කොහොමවුණත් ජෝර්ජ් ක්ලූනි එක්ක සම තැනක සංසන්දනය වෙන්න ලැබුණු එක ගැන මම සතුටුවෙනවා," හේ නිහතමානී ස්වරයෙන් කීය.

එස්තර් ඔහු දෙස බැල්මක් හෙළුවාය. "ඔයාගෙ පෙනුම ටිකක් ඒ වගේ තමයි."

"හැබැයි ජැක් ඊට වඩා හුඟක් කඩවසම්," ඇඩම් කීවේ නියවමිනි. "ජැක් ග්‍රේස්ව බැඳපු එක අපිට කොයිතරම් සහනයක් වුණාද කියන එක කියන්නම ඕනේ. අඩුමගාණේ ඒකෙන් අපේ ඔෆිස් එකේ කෙල්ලෝ ජැක් ගැන හීන මවන එක හරි නතර වුණා. කෙල්ලෝ වගේම කොල්ලොත්," හේ හිනැහෙමින් කීය.

ජැක් ඉවසිලිමත්ව සුසුමක් හෙළීය. "ඔය මදැයි ඇඩම්."

"ඔයා රස්සාවක් කරන්නෙ නෑ නේද?" එස්තර් ඇසුවේ මා දෙසට හැරෙමිනි. රැකියාවක යෙදෙන කාන්තාවන්, රැකියාවක් නොකරන කාන්තාවන් කෙරෙහි දක්වන සියුම් අවමන් හැඟීමක් ඇගේ ස්වරයෙහි ගැබ්ව ඇති බවක් මට දැනුණු නිසාම, නිරායාසයෙන්ම මම මගේ තත්ත්වය රැකගැනීමට පෙලඹීමි.

"මම රස්සාවක් කළා. ඒත් ජැක්ව කසාද බැන්දට පස්සේ මම ඒක අතහැරියා."

"ඇත්තට?" එස්තර් මුහුණ හකුළුවාගත්තාය. "ඒ ඇයි?"

"එයාට තවදුරටත් ඒ රස්සාව කරන්න ඕන වුණේ නෑ," ජැක් කතාවට මැදිහත් විය. "එයා හුඟක් හොඳ රස්සාවක් කරේ. මට ඕන වුණෙත් නෑ හැම හවසකම ග්‍රේසුත් මම තරමටම මහන්සි වෙලා ගෙදර එනවා දකින්න. එයාගේ රස්සාව අතහරින්න කියපු එක මගේ ආත්මාර්ථකාමීකම වෙන්න ඇති. ඒත් මට ඕන වුණේ ගෙදර ඇවිත් මගේ මහන්සිය නිවාගන්න මිස, තවත් මහන්සියකට, ආතතියකට එකතුවෙන්න නෙවෙයි. අනිත් එක, ග්‍රේස්ගේ රස්සාව එක්ක එයාට හුඟක් එහෙ මෙහෙ යන්න තිබුණා. ඉතින් ගෙදර තනියම ඉන්න වෙන එකත් මම අකමැති දෙයක්. මොකද, මම අවුරුදු ගාණක්ම තනියම ජීවත්වුණ කෙනෙක් නිසා."

"මොකක්ද ඔයා කරපු රස්සාව?" එස්තර් ඇසුවේ ඇගේ ළා නිලට හුරු දෑස් මා කෙරෙහිම රඳවාගනිමිනි.

Copyrighted Material



"මම හැරඩ්ස් එකේ ගැනුම්කාරිනියක්."

ඇගේ දෑස්වල මතුවූ දිස්නයෙන්, මගේ පිළිතුර ඇගේ සිතට වැදුණු බව පැහැදිලිය. කෙසේවෙතත් තවදුරටත් ඒ ගැන ඇය මගෙන් නොවිමසීම තුළින්, ඇගේ ඒ පැහැදීම පෙන්වීමට ඇය සූදානම් නැති බව මම වටහාගතිමි.

"එයා පළවෙනි පන්තියේ සීට්වල ලෝකෙ වටේම ගිහින් තියෙනවා," ඩයැන් හුස්ම අල්ලාගෙන කීවාය.

"ලෝකෙ වටේම නෙවෙයි," මම ඇයව නිවැරැදි කළෙමි. "හුඟක්ම දකුණු අමෙරිකාවට. මම වැඩියෙන්ම කළේ චිලීවලින්, ආජන්ටිනාවෙන්, හැරඩ්ස් සමාගමට ඕනකරපු පලතුරු ගන්න තැන් හොයලා දීපු එක," මම ඒ විස්තරය කළේ එස්තර්ගේ දැනුවත්වීම පිණිසය.

රූෆස්, අගය කරන්නාක් වැනි බැල්මක් මා වෙත හෙළීය. "ඒක හරිම හිත් ඇදගන්න විදිහෙ රස්සාවක් වෙන්න ඇති."

"අපොයි ඔව්." මම හිස වැනීමි. "මම මගේ රස්සාවේ ගෙවුණ හැම විනාඩියකටම කැමතියි."

"එහෙනම් දැන් ඒක නොකර ඉන්න එකෙන් ඔයාට කම්මැළි ඇති," ඒ එස්තර්ය.

"නෑ, ඇත්තම කිව්වොත් නෑ," මම බොරුවක් කීමි. "මේ ගෙදර මට කම්මැළිකමක් නොදැනෙන්න වැඩ හුඟක් තියෙනවා."

"අනික, වැඩි කාලයක් යන්න කලින් මිලී ආවම ඔයාට එයාව බලාගන්නත් තියෙනවනේ."

"මිලී එයාගේ හුඟක් දේවල් තනියෙන් බලා කියාගන්නවා. අනික, එයා මෙහෙ ආවම හුඟක් වෙලාවට මෙඩෝ ගේට්වල වැඩට යයි."

"අර ගෙවතු මධ්‍යස්ථානයේ?"

"ඔව්. එයා මල් පැළවලට හරි ආසයි. ඉතින් එතැන ඒ වගේ අපූරු රස්සාවක් ලැබුණු එකත් ඇත්තටම එයාගේ වාසනාවක්."

"එතකොට ඉතින් දවස තිස්සෙම ඔයා මොකද කරන්නෙ?"

"දැනට කරගෙන ඉන්න දේවල්ම තමයි ඉතින්. ඔයාලා දන්නවනේ, උයන පිහන වැඩ, ගේ අස්පස් කරන ඒවා, ගෙවතු වගා වැඩ. ඒ ඉතින් කාලගුණයෙන් ඉඩක් ලැබෙනවානම් තමයි."

"ඊළඟ වතාවේ ඔයාලා ඉරිදා දවසක දවල් කෑමකට එන්න. ගෙවත්තත් බලන්න පුළුවන්," ඒ ජැක්ය. "ග්‍රේස්ට තියෙන්නේ ගෙවතු වගාවට ගැළපෙන මැජික් ඇඟිලි."

Copyrighted Material



"දෙවියනේ," එස්තර් කීවේ මෘදු ස්වරයෙනි. "ඔයා කී දේකට දක්ෂයිද? මට නම් ශාන්ත පොලිකාප් ඉස්කෝලේ රස්සාව ලැබුණු එක ගැන මට හුගක් සතුටුයි. දවසම ගෙදර ඉඳලා මමත් කම්මැළිකමේ හිටියේ."

"කවදා ඉඳන්ද ඔයා වැඩ පටන්ගන්නේ?"

"ඊළඟ මාසේ ඉඳලා. මාතෘ නිවාඩු අරන් ඉන්න ටීචර් කෙනෙක් වෙනුවටයි මම වැඩට යන්නේ."

මම රූෆස් දෙසට හැරුණෙමි. "ජැක් කිව්වා ඔයාලට හුගක් ලොකු ගෙවත්තක් තියෙනවා කියල," මම අලුත් කතාබහක් ආරම්භ කළෙමි; අනතුරුව භාජනය තුළ තවමත් උණුසුම්ව ඇති හරක්මස් සහ එළවුළු, මේසය වටා බෙදන්නට වීමි. සියල්ලන්ගේම කතාබහ මා කෙරෙන් මිදී ගෙවතු වගාවන් කෙරෙහි යොමුවන්නට වූවේ ඒ අතරය. සියල්ලන්ම සිනාසෙමින් කතාබස් කරන අතරතුර අනෙක් ගැහැනුන් දෙදෙනා දෙස උකටලී හැඟීමෙන් බලාහිඳින මා සිතුවේ එස්තර් හෝ ඩයැන් යන දෙදෙනාගෙන් අයෙකු වීමට ඇත්නම් කෙතරම් අපූර්වද යන්නයි. එනම් මිලී ගැන වදවීමට නොවීම. එසැණින් මගේ සිත වසාගත්තේ මහා වරදකාරී හැඟීමකි. මම මිලීට මගේ ජීවිතයටත් වඩා ආදරය කළෙමි. මුළු ලෝකයම ලැබුණත් මම ඇගේ කිසිවක් වෙනස් නොකරමි. ඇය ගැන සිතීම තුළින් පමණක් මට නව අධිෂ්ඨානයක් දැනිණි. මම කිසියම් අදහසකින් යුතුව හුනස්නෙන් නැඟිටගතිමි.

"හැමෝම අතුරුපස කන්න ලෑස්තිද?" මම ඇසීමි.

ජැක් සහ මම මේසය අස්පස් කළෙමු. අනතුරුව හේ මා පසුපස කුස්සිය දෙසට ඇවිද ආවේය. එහිදී මා පිඟන් සියල්ල පසුව සෝදාදැමීමට සින්කය මත පිළිවෙළට අසුරන අතරතුරදී ජැක්, මස් කැපීමට භාවිත කළ පිහිය පසෙකින් ඇසිරීය. මා විසින් පිළියෙල කළ අතුරුපස, සුවිශේෂී අතුරුපසකි. ඒ ඩෙවෝන් ක්‍රීම්වලින් පිරවූ අඟල් තුනක් උසැති, මනා හැඩයට සැකසූ ම'රැන්ග් නෙස්ට් නම් අතුරුපසයි. මා විසින් කල්වේලා ඇතුව සකසා තිබූ පලතුරුවලින් අඹ, අන්නාසි, ගස්ලබු සහ කිවි කැබැලි, ක්‍රීම් තට්ටුව මත ප්‍රවේශමෙන් තැබූ මම, අනතුරුව ඊට ස්ට්‍රෝබෙරි, රාස්බෙරි සහ බ්ලූබෙරි එක්කළෙමි.

මා දෙළුම්ගෙඩිය අතට ගනිත්ම එහි ස්පර්ශය මාව අතීතයේ එක් මොහොතක, එක් තැනකට ගෙන යෑමට සමත් විය. මගේ මුහුණ දෙවූ හිරු රශ්මියත්, උනන්දුවෙන් කතාබහෙහි යෙදෙන මිනිස් හඬේත්

Copyrighted Material



වටිනාකම මට මින් පෙර දැනී තිබුණේ නැත. කලෙකට ඉහතදී උරුමව තිබූ ජීවිතය සිහිපත් කරමින් මම යාන්තමින් ඇස් වසාගතිමි.

එක්වනම එහි සිට මා වෙත අත දිගු කළ ජැක් නිසා, පියවි සිහියට පැමිණි මම දෙළුම්ගෙඩිය ඔහු අත තැබීමි. ඔහු එය දෙකට කැපූ අතර, මම හැන්දකින් ඒ තුළ වූ ඇට ඉවත්කළ මම ඒවා අනෙක් පලතුරු මතින් ඉසීමි. අතුරුපස සම්පූර්ණ විය. ඉනික්බිති මා එය කෑම කාමරයට රැගෙන එනවිට මේසය වටා සිටියවුන්ගේ විස්මයජනක ප්‍රතිචාරයෙන් මට හැඟුණේ, අතුරුපස ලෙස සැකසීමට මා ගත් තීරණය චෙස්ට්නට් සහ චොක්ලට් මිශ්‍රිත කේක් වර්ගය වෙනුවට ජැක් තේරූ මෙම අතුරුපස වඩාත් උචිත බවයි.

"ග්‍රේස් කවදාවත් කෑම ඉවිල්ල ගැන කොහෙන්වත් ඉගෙනගෙන නෑ කියලා මම ඔයාට කිව්වොත් ඔයා විශ්වාස කරනවද?" ඩයෑන්, එස්තර්ට කීවේ ඇගේ හැන්ද අතට ගනිමිනි. "මේ තරම් සර්වසම්පූර්ණ හැකියාවක් මට නම් හිතාගන්නවත් බෑ. ඔයා මොකද හිතන්නෙ? හැබැයි ඉතින් මේ යන විදිහට මම අරගත්ත බිකිනිය මට කවදාවත් අඳින්න නම් බැරිවෙයි," සිය නිල් පැහැ ලිනන් ඇඳුම මතින් බඩට තට්ටුවක් දමන අතර ඕ කොඳුළාය. "අපි ගිම්හාන නිවාඩුවකට දිනත් වෙන්කරගෙන ඉන්න එකේ මම මේක කන්න හොඳ නෑ තමයි. ඒත් මේක කොච්චර රසද කියනවානම් මට ඒක පාලනය කරගන්න බෑ!"

"කොහෙද ඔයාලා යන්නේ?" ඒ රූෆස්ය.

"තායිලන්තේ," ඇඩම් කීය. "අපි හිටියේ වියට්නාම් යන්න. ඒත් ජැක්, ග්‍රේස් දෙන්නා ගිය සැරේ නිවාඩුවට තායිලන්තෙ ගිහින් ඇවිත් පෙන්නපු ෆොටෝස් දැක්කට පස්සේ අපි හිතුවා ලබන අවුරුද්දෙ වියට්නාමෙ යන්න." හේ ඩයෑන් දෙස බලමින් නියවීය. "මේ දෙන්නා නතරවෙලා හිටිය හෝටලේ දැක්කට පස්සේ ඩයෑන්ගෙන් බේරිල්ලක් නැතිවුණා."

"ඔයාලත් ඒ හෝටලේටමද යන්නෙ?"

"නෑ, අවාසනාවට ඒක සම්පූර්ණයෙන්ම වෙන්වෙලා. අපිට ඉතින් අවාරෙට නිවාඩු ගතකරන්න යන්න තරම් වත්කමක් නෑනේ."

"පුළුවන් කාලෙදි හැමදේම කරගන්න ඕනෙ," එස්තර් කීවේ මා දෙසට හැරෙමිනි.

"මාත් හිතන්නෙ එහෙමයි."

"ඔයාලා මේ අවුරුද්දෙත් තායිලන්තෙ යනවද?" ඇඩම් ඇසීය.

Copyrighted Material



"ජූනිවලට කලින් යන්න ඉඩක් ලැබුණොත් තමයි, ඒත් මේ ඉස්සරහට එන්න තියෙන ටොමැසින් නඩුවත් එක්ක එහෙම ඉඩක් ලැබෙයි කියලා හිතන්න අමාරුයි," ඒ ජැක්ය. හේ මේසය හරහා මා දෙස හෙළුවේ අර්ථාන්විත බැල්මකි. "ඊටපස්සෙ ඉතින් මිලී අපි එක්ක ඉන්න එනවනේ."

මා මොහොතකට හුස්ම සිරකරගත්තේ, ජූනි වනතෙක් හිඳ මිලීවද අපේ ගමනට එක්කරගන්නා ලෙස කිසිවෙකුත් යෝජනා නොකරනු ඇතැයි බලාපොරොත්තුවෙනි.

"ටොමැසින්?" රූෆස්ගේ ඇහිබැමි ඉහළ නැංවී තිබිණි. "ඒක ගැන මම මොකක්හරි අහලා තියෙනවා. එයාගෙ නෝනා ඔයාගෙ සේවාදායිකාවක්ද?"

"ඔව්."

"ඩීනා ඇන්ඩර්සන්," හේ කීවේ මහත් උනන්දුවෙනි. "ඒක නම් හරි හිත් ඇදගන්න විදිහේ නඩුවක් වෙන්න ඕනේ."

"අපොයි ඔව්," ජැක් ඊට එකඟ විය. හේ මා දෙසට හැරිණ. "වස්තුවේ, හැමෝම කාලා ඉවරයිනම් ඔයා එස්තර්ට පෙන්නන්නකෝ අපි පහුගිය නිවාඩුවේ තායිලන්තෙ ගිහින් ගත්ත පින්තූර?"

මගේ හදවත ගිලාබසින්නාක් සේ මට දැනිණ. "මට විශ්වාසයි අපේ නිවාඩුවේ පින්තූර බලලා කාලේ නාස්ති කරගන්න එයා කැමතිවෙන එකක් නෑ කියලා," මා කීවේ මගේ හඬ හිතාමතාම සැහැල්ලු ස්වරයක රඳවාගනිමිනි. කෙසේවෙතත් ජැක් සහ මා අතර යාන්තමින් හෝ පෙනෙන්නට ඇති පරස්පර අදහස් ඝට්ටනය එස්තර්ට ප්‍රමාණවත් වනු ඇත.

"අනේ මම හරි ආසයි ඒවා බලන්න!" ඕ කීවාය.

ජැක් ඔහුගේ පුටුව පසෙකට තල්ලුකර සිටගත්තේය. අනතුරුව හේ ලාච්චුවක තුබූ පින්තූර ඇල්බමය ගෙන එස්තර්ගේ අත තැබීය. "ඔයාලා ෆොටෝ බලන අතරේ මමයි ග්‍රේසුයි කෝපි හදන්නම්. ඔයාලා ගිහින් විසිත්ත කාමරයේ ඉඳගත්තොත් හොඳයි නේද? එතන මීට වඩා සැපපහසුයි."

කුස්සියේ සිට අප කෝපි රැගෙන විසිත්ත කාමරයට එනවිට ඩයෑන් පින්තූර එකින් එක බලමින් මහහඬින් කෑගැසීය. එස්තර් සිටියේ තරමක් නිහඬවය.

එම ඡායාරූප සියල්ල සුන්දර බව මම පිළිගතිමි. මා පෙනෙන්නට ඇති සියලු ඡායාරූපවල මා දිස්වුණේ අතිශය

Copyrighted Material



සුරුපිනියක ලෙසිනි. හිරු රැසින් දුඹුරු පැහැගැන්වුණු සමකින් යුත් මම, ජීවිතයේ තෙවැනි දශකය ගෙවන්නියක මෙන් සිහින් සිරුරින් යුතුව, නාන ඇඳුමකින් සැරසී හිඳිනු පෙනිණි. බොහෝ ඡායාරූපවල මා සුඛෝපභෝගී හෝටලයක් ඉදිරිපස හෝ පෞද්ගලික මුහුදු වෙරළක වැතිරගෙන හෝ, නො එසේනම් අවන්හලක හෝ තැබෑරුමක, විවිධාකාර වර්ණයන්ගෙන් යුත් කොක්ටේල් පානයක් සහ නේක ආහාර වර්ග පිරවූ පිඟන් මා ඉදිරියේ තබාගෙන හිඳිනු පෙනේ. සෑම ඡායාරූපයකම මා කැමරාව දෙස බලමින් සිනාසෙමින් හිඳින අතර, ඒවායින් පෙනෙන්නේ සිය ස්වාමිපුරුෂයා සමඟ ඉමහත් ප්‍රේමයෙන් වෙළුණු, සැහැල්ලු සහ සැපවත් දිවියක් ගෙවන ගැහැනියකි. ඡායාරූප ගැනීමෙහිලා ජැක් පරිපූර්ණවාදියෙකි. ඔහු එකම ඡායාරූපය තමාට අවශ්‍ය ප්‍රතිඵලය ලැබෙන තෙක් යළි යළිත් ගන්නා නිසාම, පළමු වතාවෙන්ම එය නිවැරදි ලෙස ගැනීමට මම පුරුදුව සිටිමි. අතරමඟදී හමු වූ ආගන්තුකයන් විසින් ගනු ලැබූ අප දෙදෙනාගේම ඡායාරූපද ඇල්බමයේ තිබේ. එවන් ඡායාරූපවල මම සහ ජැක් කැමරාව දෙස බලාහිඳිනු වෙනුවට එකිනෙකා දෙස ආදරයෙන් බලාසිටි බැව් පෙන්වමින් ඩයෑන් සරදම් කළාය.

ජැක් කෝප්පවලට කෝපි වත්කළේය.

"කාටහරි චොක්ලට් කෑල්ලක් ඕනෙද?" මා ඇසුවේ හැකි උපරිම අන්දමෙන් අහම්බයක් ලෙස පෙන්වමින් එස්තර් විසින් ගෙන ආ චොක්ලට් පෙට්ටිය වෙත අත යොමමිනි.

"මං නම් හිතන්නෙ අපි ඇතිවෙන්න කාලා ඉන්නෙ කියලා," ජැක් යෝජනා කළේ එය අනුමත කරවාගැනීමට සියල්ලෝම දෙස බැල්මක් හෙළමිනි.

"අපොයි ඔව්," ඒ රූෆස්ය.

"මටත් වෙන නම් කිසිදෙයක් කන්න බෑ," ඇඩම් කෙඳිරිගාමින් කීය.

"එහෙනම් මම මේක වෙන දවසකට ගන්න අරන් තියන්නම්," ජැක් චොක්ලට් පෙට්ටිය අතට ගත්තෙන්, එය මට කිසිදාක රසවිඳීමට නොහැකි බවට මා සිත හදාගන්නා විටම මගේ ගැලවිල්ලට ඉදිරිපත් වුණේ ඩයෑන්ය.

"කෝ කෝ ඔහොම ඉන්න. මට චොක්ලට් පෙත්තක් දෙකක් කන්න ඉඩ තියෙනවා කියලා විශ්වාසයි."

Copyrighted Material



"ඔයාගේ බිකිනි එක ගැන මතක් කරන එකේ තේරුමක් නෑ කියලා මම හිතනවා," ඇඩම් සුසුමක් හෙළුවේ සිය බිරිඳ දෙස බලා සරදමින් මෙන් හිස වනමිනි.

"කිසිම තේරුමක් නෑ," ජැක්, තමා අතට දුන් චොක්ලට් පෙට්ටියෙන් චොක්ලට් පෙත්තක් ගෙන, පෙට්ටිය යළි මා අතට දෙන ඩයෑන් ඊට එකඟවූවාය. මමද චොක්ලට් පෙත්තක් ගෙන මුවෙහි ලාගෙන, එස්තර් අතට පෙට්ටිය දුනිමි. ඇය එය ප්‍රතික්ෂේප කළ බැවින් මම තවත් පෙත්තක් අතට ගෙන යළිත් එය ඩයෑන් අතටම දුන්නෙමි.

"කොහොමද ඔයා ඒක කරන්නෙ?" ඩයෑන් ඇසුවේ මා දෙස පුදුමයෙන් බලමිනි.

"මොකක්ද?"

"ඔච්චරටම කාලා පොඩ්ඩක්වත් මහත් නොවී ඉන්න එක."

"වාසනාව වෙන්න ඕනේ," මම කීවේ තවත් චොක්ලට් පෙත්තක් අතට ගනිමිනි. "ඒ වගේම පාලනය."

ඒ මොහොතේ රාත්‍රි දොළහයි තිහ සටහන් කරමින් ඔර්ලෝසුව නාද විය. නිවෙස බලා යාමට කාලය එළැඹ ඇතැයි එස්තර් යෝජනා කළේ එවිටය. සාලය වෙත ඇදුණු පසු සියල්ලන්ගේම කබා ඔවුනොවුන් අතට දුන් ජැක්, ඩයෑන් සහ එස්තර්ට ඒවා පැලඳගැනීමට උදව් කළේය. මීළඟ සිකුරාදා දහවල් දොළහයි තිහට, නගරයේ ඇති චෙස් ලුයිස් නම් අවන්හලේදී දිවා ආහාරය සඳහා ඔවුන්ව මුණගැසීමට මම එකඟ වීමි. මා වැලඳගත් ඩයෑන් සමුගත්තාය. එස්තර්ට අතට අත දෙන අතර සිකුරාදා යළි ඇයව මුණගැසීමට මම බලාහිඳින බැව් පැවසීමි. මට හාදුවකින් සමුදුන් රූෆස් සහ ඇඩම්ද එවන් සර්වසම්පූර්ණ සන්ධ්‍යාවක් වෙනුවෙන් යළි යළිත් ස්තුතිවන්ත වූහ. ඔවුන්ට සමුදී ජැක් විසින් නිවෙසේ දොර වසාදැමෙන මොහොත වනවිට 'සර්වසම්පූර්ණ' යන වදන සාලය පුරා දෝංකාර දෙන අයුරු මට දැනේ. ඉදින් මම ජයග්‍රාහී සන්ධ්‍යාවක් ගෙවූ බව මම දනිමි. එය ජැක්ද දැනගත යුතු බවට මම වග බලාගතිමි.

"හෙට අපි එකොළහට යන්න ඕනේ," මම ඔහු දෙසට හැරී කීවෙමි. "මිලීව දවල් කෑමට අරන් යන්න වෙලාවට එතැනට යන්න ඕනේ."

Copyrighted Material

# අතීතය

මාස දහ අටකට පෙර දිනෙක, එනම් ජැක්, මිලී සමග උද්‍යානයේදී නර්තනයේ යෙදුණු දින සිට මගේ ජීවිතය සර්වසම්පූර්ණ විය. එස්තර්ට මා කී ඇතැම් කරුණු සත්‍යය. ඉන් පෙර සතියේ ඉරිදාවේදී ඔහුව මගේ නෙතගැටුණු නමුත් මා වැන්නියක කෙරේ ඔහු උනන්දු වේයැයි මම නොසිතුවෙමි. ඊට ප්‍රධානම හේතුව ඔහු අතිශය කඩවසම් වීමත්, එකල මා දැන් තරමට සුරූපිනියක නොවීමත්ය. දෙවැන්න මිලීය.

මගේ පූර්ව ආදර සබඳතාවලදී මම මුල සිටම මිලී ගැන අනෙක් පාර්ශ්වය දැනුවත් කර ඇත්තෙමි. නමුත් විටෙක, මා ඔවුන්ට සැබැවින්ම කැමැත්තක් දැක්වූයේ නම්, මා සඳහන් කරන්නේ ඈත පළාතක නේවාසිකව පාසල් යන බාල සොයුරියක මා හට සිටින බැව් පමණකි. ඈ විශේෂ අවශ්‍යතා ඇති දැරියක බව මා කියන්නේ ආදර සම්බන්ධයක සති කිහිපයක් ගෙවීගිය තැනය. ඉදින් මා එය කී පසු ඇතැමුන්ට පෙරළා කිව යුත්තේ කුමක්ද යන්න ගැන අවබෝධයක් තිබුණේ නැත. ඇතැමුන් යමක් පෙරළා කීමට තරම් කාලයක් මා සමග රැඳුණේද නැත. ඇතැම්හු ඒ ගැන උනන්දුවක් පෙන්වා, සහාය දෙන බවක් මවා පෙන්වුවද මිලීව මුණගැසුණු කල ඇගේ නිරායාසයෙන්ම උපන් ගති විලාසයන් ජැක් මෙන් අපූර්ව අන්දමකට තේරුම්ගැනීමට අසමත් වූහ. ඒ අතරින් දෙදෙනෙකු මිලීව මුණගැසුණු පසුවද බොහෝ කලක් යනතෙක් මා සමග හුන්නද, කාලයත් සමග මිලී මගේ ජීවිතයේ